**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

**------------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

-------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාර කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්**,** එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම් එකතුව රු.2,398,948 ක් සහ පුද්ගල පඩිනඩි රු. 42,545,229 ක් වුවද ,එය රු.4,651 සහ රු.38,198,632 ක් ලෙස හරස් සටහන් මගින් ඉවත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි**.** | ඔබගේ නිරීක්ෂණ පරිදි මාර්ගෝපදේශ අංක 06 හි 3.1 හා 3.6 පරිදි අදාළ හරස් සටහන් ගැළපීම් කරන ලද සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි. | මාර්ගෝපදේශ අංක 06 හි උපදෙස් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් පිළිවෙලින් රු.3,029,541 ක් හා 1,850,764 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු. 48,320 ක් හා රු. 1,004,943 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ලැබීම් රු.21,950 ක් දක්වා නොතිබුණි. | එම- | එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි අංක 208 යටතේ දෙපාර්තමේන්තුව වෙනත් දෙපාර්තමේන්තු වැය විෂයයන් වෙනුවෙන් දරන ලද රු.205,051 ක් හා වෙනත් දෙපාර්තමේන්තු තම ප්‍රධාන ලෙජර් වෙනුවෙන් දරන ලද රු.102,138 ක් අක් මුදල් ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | පිළිගනිමි. සංශෝධිත අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. | එම- |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 හා 05 වගන්ති. | එක් එක් නිලධාරියා වෙනුවෙන් කාර්යසාධන ගිවිසුම් අත්සන් කර, දෙපාර්තමේන්තුව තුළ කටයුතු කරනු ලබන මානව සම්පත සැලසුම් සහගතව සංවර්ධනය කිරීම වෙනුවෙන්, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.<br>2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වියයුතුය. |

## 3. යහපාලනය

### 3.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට හා මහජන විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වුවද එසේ කර නොතිබීම හේතුවෙන් ආයතන ක්‍රියාවලිය අධීක්ෂණය හා ඇගයීම සිදුවී නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි.<br><br>සම්පූර්ණ ආයතනය තුළ පුරවැසි හා සේවාලාභී ප්‍රඥප්තිය ස්ථාපිත කිරීම සඳහා ආයතනයෙහි 2021 ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඇතුළත් කර අනුමැතිය ලබා තිබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |

### 3.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ විධිවිධාන ඉටුවන පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | 2019.04.06 දින සිට අනුමත කර ඇති අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධරයකු අනුයුක්ත කර දෙන මෙන් හා එතෙක් වැඩබලන නිලධරයකු හෝ මෙම කාර්යාලයට අනුයුක්ත කර දෙන මෙන් අවස්ථා කිහිපියකදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත. | පනතේ විධිවිධාන වලට අනුකූල වියයුතුය |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

-----------------------

ද්විතීයික මට්ටමේ පැවති පුරප්පාඩු 13 න් 09 ක් පේටන්ට් පරීක්ෂක තනතුර වෙනුවෙන් වූ අතර , එම තනතුරට අදාළ අනුමත සේවක සංඛ්‍යාව 10 කි. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 90 ක ප්‍රතිශතයක් පුරප්පාඩු වී තිබුණි. එමෙන්ම මෙම තනතුර පේටන්ට් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට ඍජුව සම්බන්ධ වන බැවින් එම ක්‍රියාවලියේ ප්‍රමාදයට බලපෑම් කිරීමට ඇති හැකියාව බැහැර කළ නොහැකි බව නිරීක්ෂණය විය.

**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

-------------------------------------------

2020 වර්ෂයේ රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කර විවෘත තරඟ විභාගයක් මගින් සුදුසුකම් සපුරන අය බඳවා ගැනීමට කටයුතු සූදානම් කර තිබූ අතර උද්ගත වූ කොවිඩ් 19 වසංගත තත්වය නිසා අපේක්ෂිත පරිදි කටයුතු කිරීමට නොහැකි විය.

2020 වර්ෂයේ පැවති ජනාධිපති උපදේශක කමිටු තීරණ අනුව පේටන්ට් පරීක්ෂකවරුන් බඳවා ගන්නා තුරු නවක අභ්‍යාසලාභීන් අනුයුක්ත කර රාජකාරි කටයුතු ඉටු කරවා ගන්නා ලෙස ලබා දුන් උපදෙස් අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත හා ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

එලෙස ම එම බඳවා ගැනීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් කරුණු විමසීමට ලිපියක් යොමු කර ඇති අතර එම ලිපියට පිළිතුරු ලැබුණු වහාම අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

**නිර්දේශය**

-----------

පේටන්ට් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට ඍජුව සම්බන්ධ වන බැවින් බඳවාගැනීම් ප්‍රමාද නොකළ යුතුය.